## උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා වගවීමට සැබෑ උවමනායක් ප්‍රදර්ශනය නොකරන

## 2012 මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම

එල්. ටී. ටී. ඊ සංවිධානයට එරෙහි යුද්ධය අවසාන වී තෙවසරක් ගෙවී ගියත්, ශ්‍රී ලංකාව තුළ අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම, වධ හිංසා පැමිණවීම හා වෙනත් අවමන් සහගත ක්‍රියා වලට භාජනය කිරීම, බලහත්කාර අතුරුදහන් කිරීම හා අත් අඩංගුවේ සිටිය දී ඝාතනය කිරීම වැනි මානව හිමිකම් බරපතළ ලෙස උල්ලංඝණය වන බව වාර්තා වන නමුත්, වරදකරුවන්ට නිතීයානුකූලව දඬුවම් පැමිණවීමක් ද දක්නට නොලැබේ.

බලධාරීන් විසින් සිය ගණනක් පුද්ගලයින් එල්. ටී. ටී. ඊ. සැකකරුවන් වශයෙන් රඳවා තබා ගැනීමට තවමත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පණතෙහි පිහිට පතයි. සැකකරුවන් බන්ධනාගාර ගත නොකොට රඳවා තබා ගැනීමට බලධාරීන්ට බලය පවරන මෙම පණත, එලෙස රඳවා තබා ගැනීමේ දී වධහිංසාවන්ට භාජනය වූවන්ට, තමන් වධහිංසාවන්ට භාජනය වූ බවට ඔප්පු කිරීමේ වගකීම ද සැකකරුවන්ටම පවරයි. විසම්මුතිය මර්දනය කරනු පිණිස භාෂණයේ හා සමාගමයේ නිදහස පාලනය කරන මෙම පණතට ආදළ ගැටළු පිළිබඳව ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් සවිස්තරාත්මකව වාර්තා කොට ඇත.[1]

ශ්‍රී ලංකාවේ සිදු වූ යුද්ධ අපරාධ ඇතුළු බරපතළ මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් 2012 මාර්තු 22 වන දින එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් සම්මත කරන ලද යෝජනාව ( යෝජනා අංක 19/2 ) වැදගත් මං සලකුණක් සනිටුහන් කරයි. එමගින් ශ්‍රී ලංකාවට උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන ' විස්තීරණ ක්‍රියාකාරී සැලස්මක් ' පිළියෙළ කිරීමට යෝජනා කරන ලදී.[2] ඉහත කී යෝජනාව විසින් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් උල්ලංඝණය වීම ජාත්‍යයන්තර නිතීයේ රාමුව තුළ සලකා බැලීමට අසමත් වූ බව පිළිගත් නමුත්, අනාගතයේ දී කරනු ලබන විමර්ශනයන් ජාත්‍යයන්තර නිතීයට අනුකූල විය යුතු බව ද අවධාරණය කළේය[3].

2012 ජුලි මාසයේ දී උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ නිර්දේශ 285 න් ඉතා සීමිත සංඛ්‍යාවක් එනම් 92 පමණක් අඩංගු ජාතික ක්‍රියාකාරී සැලස්මක් එළි දැක්වීය. ඊට ක්‍රියාකාරකම් පිළිබ ද දළ සටහනක්, වගකීම භාර ගන්නා රාජ්‍ය ආයතනය, කාල රාමුවක් හා ක්‍රියාකාරිත්වය මැන බැලිය හැකි නිර්ණායකයන් ද ඇතුළත් වීය.[4] කෙසේ වෙතත් මෙම සැලැස්මට බරපතළ මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ වගවීමක් ඇතුලත් නොවුවා පමණක් නොව ජාතීන් අතර සංහිඳියාව පිණිස අවශ්‍ය තීරණාත්මක ප්‍රතිසංස්කරණයන් ද කල් දමමින් තවමත් නොපිහිට වූ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවකට එම කාර්ය යොමු කර තිබුනී.

මෙම සැලැස්මෙහි වගවීම පිළිබඳ යෝජිත පියවරයන් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව විසින් ඉතාමත් නිශ්චිතව මානව හිමිකම් හා මානවීය නිතීය උල්ලංඝණය සම්බන්ධයෙන් ස්වාධීන විමර්ශනයක් හා නඩු පැවරීමක් සම්බන්ධයෙන් ඉදිරිපත් කොට තිබූ නිර්දේශ, මෙම සැලැස්මට ඇතුළත් කොට තිබුනේ ඉතාමත් අවිනිශ්චිත පෙළ ගැසීමක් ලෙසටය. ඇතැම් යෝජිත පියවරයන් පිළිබඳ වගකීම පවරා තිබුනේ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් දැනටමත් පෙන්වා දී

ඇති පරිදි අකාර්‍යක්ෂම ආයතන වලටය.[5] මෙම ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධානම ඌනතාවය නම් මානව හිමිකම් බරපතළ ලෙස උල්ලංඝණය කරන රාජ්‍ය ආයතනයන්ට ම සිදු වි ඇති මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ විමර්ශනය කිරිමේ වගකීම පැවරිමයි. ත්‍රිවිධ හමුදා භටයන්, අණ දෙන නිලධාරීන් හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ නිලධාරින්ට යුද්ධ අපරාධ සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් වි ඇති අතර, උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභා නිර්දේශ ක්‍රියාත්මක කිරිමේ වගකීම ද පවරා ඇත්තේත් ආරක්ෂක අමාත්‍යංශයටම විම පුදුමයට කාරණයක් වෙයි. ඉහත කී සැලැස්මට අනුව ආරක්ෂක අමාත්‍යංශය විසින් සිවිල් වැසියන් ඝාතනය කිරීම මෙන්ම අතුරුදහන් විම පිළිබඳ චෝදනා, බලහත්කාර අතුරුදහන් කිරීම මෙන්ම අත්නෝමතිකව රඳවා තැබිම පිළිබඳ චෝදනා විමර්ශනය කළ යුතුය.[6] මෙම ක්‍රියාකාරී සැලැස්ම කිසිදු නව හෝ ස්වාධීන විමර්ශනයක් පිළිබඳ කැපවීමක් ප්‍රදර්ශණය නොකරන අතර අවධානය යොමු කර තිබෙන්නේ යුද්ධ හමුදා ආඥා පනත යටතේ විනය පරික්ෂණ පැවැත්විම කෙරෙහිය. එමඟින් මෙම ක්‍රියාකාරී සැලැස්ම උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ නිර්දේශයක් වන බලහත්කාර අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් විශේෂ කොමිෂන් සභාවක් පත් කිරීමට කළ නිර්දේශය නොසළකා හරියි.[7]

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව විසින් 'චැනල් 4 විඩියෝ පටය පිළිබඳ ස්වාධීන විමර්ශනයක් කොට සත්‍ය හෙළිදරව් කර ගත යුතු බවට යෝජනා කරන ලදී.[8] ( මෙම විඩීයෝ පටය මඟින් යුද්ධයේ අවසාන දිනවල දී ශ්‍රී ලංකා රජයේ හමුදා විසින් එල්. ටි. ටි. ඊ. සාමාජිකයින් ඝාතනය කිරිම හා ලිංගික වධහිංසාවන්ට ලක් කිරිම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කරන ලදි.) ක්‍රියාකාරී සැලැස්ම මෙම කාරණය සම්බන්ධයෙන් දැනට ආරක්ෂක අමාත්‍යංශය විසින් කරනු ලබන පරික්ෂණ තවදුරටත් ඉදිරියට ගෙන යා යුතු බවත් එහිදි හෙළිවන තොරතුරු මත අදළ පියවර ගත යුතු බවත් සඳහන් කරයි.[9] තවද මෙම ක්‍රියාකාරී සැලැස්ම විසින් ( ආරක්ෂක හමුදා සමග සහයෝගයෙන් ක්‍රියාකරන බව කවුරුත් දන්නා ) අනවසර ආයුධ සන්නද්ධ කණ්ඩායම් තහනම් කිරිමේ වගකීම ද ආරක්ෂක අමාත්‍යංශයට පවරයි[10]. එසේම මාධ්‍යවේදීන් ට පහර දෙන පොලිසියටම මාධ්‍යවේදීන් ට පහර දීම පිළිබඳ චෝදනා විභාග කිරිමේ වගකිම ද පවරා තිබේ.

සැලැස්ම විසින් සියළුම විමර්ශනයන් අපරාධ නඩු විධි විධාන සංග්‍රහය යටතේ පැවැත්විමට පියවර ගෙන ඇති නමුත් රජයේ හමුදවන් හි ඉහළ තනතුරු දරන්නන්ට එරෙහිව ස්වාධීන පරික්ෂණ පැවැත්විමක් අපේක්ෂා කළ නොහැකිය.

19/2 දරන යෝජනාව ක්‍රියාත්මක කිරිම හා ඒ පිළිබඳ වාර්තා කිරිම පිණිස ශ්‍රී ලංකාවට අවශ්‍ය ආධාර හා මඟ පෙන්විම එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසින් ඒ රටට ලබා දිය යුතු යැයි සඳහන් වුයේය.[11] මේ අනුව පසුගිය අගෝස්තු මස ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මානව හිමිකම් කාර්යාලය විසින් සැප්තැම්බර් මාසය තුළ දී ශ්‍රී ලංකාව වෙත නියෝජිත පිරිසක් එවිමට කරන ලද ඉල්ලීම ශ්‍රී ලංකා රජය විසින් පිළි ගන්නා ලදි. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මෙම පියවර අගයන අතරම මෙම නියෝජිත පිරිස ඉහත කී ජාතික සැලැස්ම ක්‍රියාත්මක කිරිමට වගකිම දරන රාජ්‍ය ආයතනයන් ගේ ස්වාධීනත්වය පිළිබඳව සොයා බැලිමට විශේෂ අවධානයක් යොමු කරන මෙන් ඉල්ලා සිටියි. එක්සත් ජාතීන් ගේ සංවිධානයේ යෝජනාව වන්නේ 'පිළිගත හැකි හා ස්වාධීන ' ක්‍රියා පිළිවෙතක් වන අතර,[12] රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශය විසින් සිය අමාත්‍යංශ්‍යය යටතේ ඇති ආයතනයන් හි නිලධාරින්ට එරෙහිව පවත්වන පරික්ෂණයක් පිළිබඳව සෑහිමකට පත් විය නොහැකි බව අවධාරණය කළ යුතුය.

ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කර ඇති මානව හිමිකම් සැලැස්ම යුද්ධයේ අවසාන අදියරේ දී රජයේ මෙන්ම එල් ටි ටි ඊ හමුදා විසින් සිදු කරන ලද අන්තර් ජාතික නිතී උල්ලංඝණය මෙන් අනෙකුත් මානව හිමිකම් චෝදනා සම්බන්ධයෙන් ද විමර්ශනයක් කිරිමට අවශ්‍ය දේශපාලන නායකත්වය කිසි සේතම පිළිඹිබු නොකරයි. ඇත්ත වශයෙන්ම එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලයේ 19/2 දරන යෝජනාව සම්බන්ධයෙන් රජය ඉදිරිපත් කරන සැලැස්ම වු කලි අන්තර්ගතයකින් තොර ක්‍රියාවලියක් වශයෙන් නම් කළ හැකිය.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් මානව හිමිකම් කවුන්සිලය හා එක්සත් ජාතීන් ගේ සංවිධානයේ සාමාජික රටවල් විසින් පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ අවධානය යොමු කළ යුතුය:

**උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව;**

- උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව හා වෙනත් සංවිධාන විසින් හඳුනා ගෙන ඇති මානව හිමිකම් හා ජාත්‍යයන්තර නිතී උල්ලංඝණයන් පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් කඩිනම්, ස්වාධීන හා පළඳයි විමර්ශනයක් කිරිමට මුලික පියවර ගැනිම; මෙම විමර්ශනයන් හි දි වැරදිකරුවන් වන තැනැත්තන්ට ඔවුන් රජයේ දරන තනතුරු හා ඒ තැනැත්තන් ගේ තරාතිරම සලකා සමාවක් දිමට හෝ සමාවක් දිමට සලකා බැලිම නොකළ යුතුය; එකී චෝදනා සම්බන්ධයෙන් වගකීම පැවරෙන රාජ්‍ය ආයතනයන්ට එම චෝදනා සම්බන්ධයෙන් විමර්ශනය කිරිමට ඉඩ නොදිය යුතුය;

**ත්‍රස්තවාදය වැළැක්විමේ නිති;**

-ත්‍රස්තවාදය වැළැක්විමේ පණත අවලංගු කිරිමත් අත් අඩංගුවට ගනු ලබන තැනැත්තන් රිමාන්ඩ් භාරයට පත් නොකොට රඳවා තබා ගැනිම අහෝසි කළ යුතුය.

- හදිසි අවස්ථා නිතිය, ත්‍රස්තවාදය වැළැක්විමේ නිති යටතේ අත්අඩංගුවට ගත් හා පුනතරුත්ථාපන කඳවුරු වල රඳවා ගෙන ඇති සියළුම තැනැත්තන්ට තිබෙන චෝදනා සම්බන්ධයෙන් එක්කෝ ශ්‍රී ලංකාවේ පිළිගත් නිතී යටතේ විමර්ශනය කිරිම හා නඩු පැවරිම එසේත් නැත්නම් ස්වාධීන සිවිල් අධිකරණයට ඉදිරිපත් කිරිම යන දෙකෙන් එකක් අනුව ක්‍රියා කළ යුතුය; මෙම නඩු විභාග ජාත්‍යයන්තරව පිළිගත් ප්‍රතිපත්තීන්ට අනුව පැවැත්විය යුතු අතර මරණීය දණ්ඩනය පැනවිමේ අරමුණින් මෙම නඩු විභාග පැවැත්විම කිසිසේත්ම නොකළ යුතුය; රැඳවියන් නිදහස් කිරිම සම්බන්ධයෙන් දැනට අධිකරණයන් විසින් ලබා දි ඇති නියෝග ( උපරිමාධිකරණය විසින් මානව හිමිකම් සම්බන්ධයෙන් ලබා දි ඇති තින්දු මෙන්ම හබයාස් කෝපුස් නියෝග) වහාම ක්‍රියාත්මක කිරිම;

**බලහත්කාරයෙන් අතුරුදහන් කළ තැනැත්තන් සම්බන්ධ ක්‍රියාකාරි කමිටුව**

-එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලයේ 19/2 යෝජනාවට අමතරව එක්සත් ජාතීන් ගේ සංවිධානයේ බලහත්කාරයෙන් අතුරුදහන් වුවන් පිළිබඳ කමිටුවට නොපමාව ශ්‍රී ලංකාවට පැමිණිමට පහසුකම් සැලසිය යුතුය;

- ශ්‍රී ලංකා රජය විසින් වරදින් නිදෙස් කිරිමේ ප්‍රතිපත්තිය ඉවත් කර ගැනිමට අසමත් වන්නේ නම් එක්සත් ජාතීන් ගේ සංවිධානය අන්තර් ජාතික නිතිය යටතට ගැනෙන ශ්‍රී ලංකා රජය හා එල් ටි ටි

ඊ සංවිධානය විසින්  මානව හිමිකම් හා මානවීය නිතීය උල්ලංඝණය කිරිම පිළිබඳ ස්වාධීන විමර්ශනයක් පැවැත්විමට සුදනම් විය යුතුය;

---

[1] See: *Locked Away: Sri Lanka's Security Detainees*, ASA 37/003/2012 at: http://www.amnesty.org/en/library/info/ASA37/003/2012/en

[2] *Promoting reconciliation and accountability in Sri Lanka*, A/HRC/RES/19/2, OP2.

[3] Ibid, preamble

[4] National Plan of Action to Implement the Recommendations of the LLRC,  26 July 2012, Official Website of the Government of Sri Lanka, http://www.priu.gov.lk/news_update/Current_Affairs/ca201207/20120726national_plan_action.htm, accessed 7 August 2012.

[5] For example, paragraph 9.63 of the LLRC final report, *(Report of the Commission of Inquiry on Lessons Learnt and Reconciliation, November 2011)* මීට උදහරණයක් වශයෙන් ' රැදිවියන් ගේ නම, රඳවා තබන ස්ථානය හා වෙනත් ස්'ථානයකට මාරු කරන ලද්දේ නම් ඒ පිළිබඳ තොරතුරුත් ඇතුලත් මධ්‍යම තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටු විම හා එම තොරතුරු රැදවියා ගේ ආසන්නතම ඥතියාට ලබා දීම සැලකිය හැකිය. තවද මෙම වාර්තාව රඳවා තබා ඇති රැදවියන් ගේ නාම ලේඛනයක් ප්‍රසිද්ධ කරන ලෙස ද නිර්දේශ කරයි. නමුත් ක්‍රියාකාරි සැලැස්ම විසින් කියා සිටින්නේ දැනට පවතින දත්ත හා තොරතුරු එකතුව තවදුරටත් පුළුල් කරමින් පොලිසිය විසින් දැනටමත් රැදවියන් ගේ ආසන්නතම ඥතියාට විස්තර සැපයිමේ ක්‍රමය අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු බවද ප්‍රකාශ කරයි. නමුත් ඇත්ත වශයෙන් ම දැනට පවතින දත්ත හා තොරතුරු එකතුවට ඇතුළත් වන්නේ ශ්‍රී ලංකා පොලිසීයට අනුබද්ධිත ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් රඳවා ගෙන ඇති රැදවියන් ගේ තොරතුරු පමණක් වන මෙම ක්‍රමයේ අසාර්ථකභාවය ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් පළ කළ ' මාවු පිට ' නැමති වාර්තාවේ සවිස්තරව සාකච්ඡා කොට ඇත.

[6] National Plan of Action at note iv.

[7] උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභා අවසාන වාර්තාවේ 9.51, 9.9 හා 9.37 යන නිර්දේශ බලන්න.

[8] National Plan of Action to Implement the Recommendations of the LLRC at note 4 above.

[9] ඉහත වාර්තාව බලන්න

[10] උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව සිය වාර්තාවේ 9.73 ඡේදයෙන් බලධාරින් ගෙන් ' අනවසර ආයුධ සන්නද්ධ කණ්ඩායම් සම්බන්ධයෙන් එල්ල වි ඇති චෝදනා සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වන මෙන්'නිර්දේශ කරයි. නමුත් ක්‍රියාකාරි සැලැස්ම ' යුද්ධයක්  පවතින අවස්ථාවක අනවසර ආයුධ සන්නද්ධ කණ්ඩායම් එම ප්‍රදේශයන් හා සැරිසරන බව සඳහන් කරමින් යුද්ධය අවසාන වි ඇති අවස්ථාවක මෙම කණ්ඩායම් සම්පුර්ණයෙන්ම ඉවත් කළ යුතු බවට නිර්දේශ කරන අතර මෙම කණ්ඩායම් නැවත බිහිවිම වැළැක්විම සඳහා පියවර ගත යුතු යැයි ප්‍රකාශ කරයි.

[11] OP3

[12] OP3